# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/28 - 2020 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා - 2020.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

**ජනාධිපති විධානය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංවර්ධන ප්‍රමුඛතා සහ ස්වයං රැකියා හා පාරම්පරික වෘත්තීන්හි නියැලෙන කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා වෙනුවෙන් භූ සම්පත් යොදා ගැනීම සහ ඒවා ලබා ගැනීමේ මූලාශ්‍ර හා ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. ජේ.ජේ. රත්නසිරි මැතිතුමා
   ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

2. අනිල් ජාසිංහ මැතිතුමා
   ලේකම්, පරිසර අමාත්‍යාංශය

3. ආර්. ඩබ්ලිව්. ආර්. පේමසිරි මැතිතුමා
   ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය

4. අනුර දිසානායක මැතිතුමා
   ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය

5. ආර්. ඒ. ඒ. කේ. රණවක මැතිතුමා
   ලේකම්, ඉඩම් අමාත්‍යාංශය



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. එම්. කේ. බී. හරිස්චන්ද්‍ර මැතිතුමා
   ලේකම්, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

7. මේජර් ජනරාල් (විශ්‍රාමික) ඩබ්ලිව්. පී. පී. ප්‍රනාන්දු මැතිතුමා
   ලේකම්, වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

8. එස්. ඩී. ඒ. බී. බොරලැස්ස මැතිතුමා
   ලේකම්, ඉඩම් කළමණාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

9. ඩබ්ලිව්. එම්. එම්. බී. වීරසේකර මැතිතුමා
   අධ්‍යක්ෂ ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

10. ආර්. එම්. සී. එම්. හේරත් මැතිතුමිය
    ඉඩම් කොමසාරිස් ජනරාල්

11. එස්. ඒ. අනුර සතුරුසිංහ මැතිතුමා
    වන සංරක්ෂක ජනරාල්

12. ඒ. එස්. ඉලංගම්ගේ මැතිතුමිය
    අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

13. පී. බී. හේමන්ත ජයසිංහ මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය

14. නියෝජ්‍ය පොලිස්පති, පරිසර දිශාව

15. අනුර වල්පොල මැතිතුමා
    සභාපති, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය

16. හර්ෂාන් ද සිල්වා මැතිතුමා
    සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය

17. මලර්මතී ගංගාධරන් මැතිතුමිය
    අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

18. ඩබ්ලිව්. එම්. කේ. පී. එස්. ආර්. ප්‍රනාන්දු මහතා
    වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

සංවර්ධන ප්‍රමුඛතා හා ජීවන අවශ්‍යතා වෙනුවෙන් භූ සම්පත් සපයා ගැනීමේ දුෂ්කරතාවයන් මතුව ඇති බැවින් ද,

හඳුනා ගන්නා එවැනි සම්පත් කැනීමේ දී හා ප්‍රවාහනය කිරීමේ දී, වර්තමාන ක්‍රියාවලිය තුළ අසීරුතාවයන්ට මුහුණ දීමට සිදුවන බැවින් ද,

එම ද්‍රව්‍යයන් ගේ අවශ්‍යතාවන්වල ඌණතාවන් නිර්මාණය වීම තුළ ඉදිකිරීම් හා සේවා සැපයීමේ පිරිවැය අධිකවී ඇති බැවින් ද,

මෙම තත්ත්වය හේතුවෙන් රට තුළ සංවර්ධන ක්‍රියාවලීන් තිරසාර ලෙස පවත්වා ගැනීමේ දුෂ්කරතා මතුවී ඇති බවට ද, පරිසර සංරක්ෂණයට හානි සිදුවන බවට ද, විවිධ අක්‍රමිකතාවන් සිදුවන බවට ද, මාගේ අවධානයට ලක්වී ඇති හෙයින් ද,

එවැනි තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණ හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු පසුබෑමකට ලක් නොවී අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමේ ක්‍රමවේදයන් හඳුනා ගැනීමේ අවශ්‍යතාවය අවධානයට ලක් කරමින්,

1. ජේ. ජේ. රත්නසිරි මැතිතුමා
   ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

2. අනිල් ජාසිංහ මැතිතුමා
   ලේකම්, පරිසර අමාත්‍යාංශය

3. ආර්. ඩබ්ලිව්. ආර්. පේමසිරි මැතිතුමා
   ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය

4. අනුර දිසානායක මැතිතුමා
   ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය

5. ආර්. ඒ. ඒ. කේ. රණවක මැතිතුමා
   ලේකම්, ඉඩම් අමාත්‍යාංශය

6. එම්. කේ. බී. හරිස්චන්ද්‍ර මැතිතුමා
   ලේකම්, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

7. මේජර් ජනරාල් (විශ්‍රාමික) ඩබ්ලිව්. පී. පී. ප්‍රනාන්දු මැතිතුමා
   ලේකම්, වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිලිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

8. එස්. ඩී. ඒ. බී. බොරලැස්ස මැතිතුමා
   ලේකම්, ඉඩම් කළමණාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

9. ඩබ්ලිව්. එම්. එම්. බී. වීරසේකර මැතිතුමා
   අධ්‍යක්ෂ ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

10. ආර්. එම්. සී. එම්. හේරත් මැතිතුමිය
    ඉඩම් කොමසාරිස් ජනරාල්

11. එස්. ඒ. අනුර සතුරුසිංහ මැතිතුමා
    වන සංරක්ෂක ජනරාල්

12. ඒ. එස්. ඉලංගම්ගේ මැතිතුමිය
    අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

13. පී. බී. හේමන්ත ජයසිංහ මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය

14. නියෝජ්‍ය පොලිස්පති, පරිසර දිශාව

15. අනුර වල්පොල මැතිතුමා
    සභාපති, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය

16. හර්ෂාන් ද සිල්වා මැතිතුමා
    සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය

17. මලර්මතී ගංගාධරන් මැතිතුමිය
    අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

18. ඩබ්ලිව්. එම්. කේ. පී. එස්. ආර්. ප්‍රනාන්දු මහතා
    වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්දර ගෝඨාභය රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය, මෙම කාර්ය භාරයේ සාමූහික වගකීමක් තුළ ජාතික සැලසුම් සකස් කිරීමේ සෘජු වගකීම් දරන්නන් වශයෙන් මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත ඔබතුමන්ලා ජාතික සංවර්ධන ප්‍රමුඛතා මෙන්ම , ස්වයං රැකියා හා පාරම්පරික වෘත්තීන්හි නියැලෙන කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා වෙනුවෙන් භූ සම්පත් යොදා ගැනීම හා ඒවා ලබා ගැනීමේ මූලාශ්‍ර හා ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සඳහාවන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

1. ගල්, වැලි හා පස් වැනි භූ සම්පත් ප්‍රධාන අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා සංවර්ධන ප්‍රමුඛතා වෙන්කර හඳුනා ගැනීම හා ඒ සඳහා වාර්ෂිකව ද්‍රව්‍යාත්මක වශයෙන් අවශ්‍ය සැපයුම් ප්‍රමාණයන් තක්සේරු කිරීම.

2. එම සංවර්ධන ප්‍රමුඛතාවයන් වෙනුවෙන් අවශ්‍ය කරන ඉහත සඳහන් අමුද්‍රව්‍ය ලබා ගැනීමට හැකි දිවයින පුරා වන ප්‍රදේශ හා ස්ථාන පරිසර සංරක්ෂණයට ප්‍රමුඛත්වය දී හඳුනා ගැනීම හා වෙන්කොට තැබීම.

3. එම ස්ථානවල කැනීම් කටයුතු කිරීමේ විද්‍යාත්මක, සරල ක්‍රමවේදයන් හඳුනා ගැනීම හා පූර්ව අනුමැතීන් සහිතව එම අමුද්‍රව්‍ය ලබා දීමේ ක්‍රමවේද අධ්‍යයනය කිරීම.

4. ගල්, වැලි හා පස් වැනි භූ සම්පත් ලබා ගැනීමට හැකි ප්‍රදේශ ආශ්‍රිතව පාරම්පරිකව ජීවත්වන පුද්ගලයින් මෙන්ම, එම සම්පත් උපයෝජන කරන නිපැයුම්කරුවන් හා ඉදිකිරීම් කර්මාන්තයේ නියැලෙන්නන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම.

5. සංවර්ධන ව්‍යාපෘති, ස්වයං රැකියා හා පාරම්පරික වෘත්තීන් හා කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා වෙනුවෙන් මූලික ඉදිකිරීම් අමුද්‍රව්‍ය වශයෙන් අවශ්‍ය කරන ගල්, වැලි හා පස් වැනි ඛනිජ සම්පත් ලබා ගැනීම, කැනීම් කිරීම හා ප්‍රවාහනය සඳහා දැනට පවත්නා නෛතික විධිවිධානයන් සමාලෝචනය කොට, ඒ සඳහා අය කෙරෙන ගාස්තු හා රාජ්‍ය අයභාරයන් ඒකාබද්ධ කර, සරල සහ කාර්යක්ෂම ක්‍රමවේදයන් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.

6. උක්ත කාර්යයන් සඳහා තත්කාලයේ පවත්නා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයට ලක්කොට, යල්පැනගිය නීති රෙගුලාසි, ආයතනික සහ පරිපාලන ව්‍යුහය නැවත සලකා බලා, යාවත්කාලීන කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ හා දැනට ක්‍රියාත්මක වන සංකීර්ණ වූ පරිපාලන ක්‍රමවේදයන් හා චක්‍රලේඛනයන් සුදුසු පරිදි යාවත්කාලීන කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

7. කැනීම් කටයුතු සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේ දී අනවශ්‍ය ප්‍රමාදවීම් වැළැක්වීම සඳහා එක් ආයතනික ව්‍යුහයක් මගින් සියලු අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.

8. ජාතික සංවර්ධන වැඩසටහන් වශයෙන් ප්‍රමුඛත්වයේ ලා සැලකෙන විවිධ භෝග වගාවන් වාණිජමය වශයෙන් වගා කළ හැකි කෘෂිකාර්මික ඉඩම්, ඉස්සන් ඇතුළු මිරිදිය මත්ස්‍ය ගොවිපල, ගව පාලනය හා කුකුලන් ඇති කිරීමේ සත්ව ගොවිපල, කර්මාන්ත හා ආයෝජන කළාප, බහලුම් අංගන හා ගබඩා සංකීර්ණ, වැලි, පස්, ගල් ආදී භූ සම්පත් කැනීමේ ස්ථාන , නාගරික සංවර්ධන හා නිවාස යෝජනා ක්‍රම, තොරතුරු තාක්ෂණ කළාප, සංචාරක කළාප හා මධ්‍යස්ථාන, මහාමාර්ග හා නාගරික පහසුකම් , ක්‍රීඩාංගන හා උද්‍යාන, කැලෑ හා ස්වභාව සෞන්දර්යය ආදී ස්ථාන ප්‍රාදේශීය වශයෙන් හඳුනාගෙන ප්‍රාදේශීය ලේකම්වරුන් හා අනෙකුත් නිලධාරීන් සමග පරිසර ඇගයීම් හා අනුමැතීන්, රජයේ තක්සේරු වටිනාකම්, යටිතල පහසුකම් හා මහජන අවශ්‍යතාවලට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකි ස්ථාන හඳුනා ගැනීම හා එම ස්ථානවල පූර්ව අනුමැතිය ඇතිව ගැසට් කිරීමට නිර්දේශ කිරීම.

තව ද, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්, ජේ.ජේ. රත්නසිරි මැතිතුමා, පූර්වෝක්ත කාර්ය සාධක බලකායේ සභාපති ලෙස පත් කරමි.

තව ද, මෙම බලකායේ ලේකම් වශයෙන් ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, කේ.ආර්. ගංගාධාර මහතා පත් කරමි.

තව ද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටු කරලීමට අදාළව අවශ්‍ය පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට උක්ත ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තව ද, පෙර කී බලකායේ සාමාජිකයින්වන ඔබ කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

තව ද, මෙම කාර්යයේ ප්‍රමුඛත්වය දිය හැකි ස්ථාන හා ක්‍රමවේදයන් පිළිබඳ දින 45 ක් තුළ මා වෙත වාර්තා කිරීම.

තව ද, මෙම ජනාධිපති කාර්ය සාධක බලකාය වෙතින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා සෙසු තැනැත්තන්ට තත් කාර්ය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියා කළ යුතු යැයි ද, ලබාදිය යුතු සියලුම සහාය සැලසිය යුතු යැයි ද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම නිලධරයන්ට හා සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තව ද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙර කී කාර්ය සාධක බලකාය විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කරන හා පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙර කී කාර්ය සාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ ඔක්තෝබර් මස 06 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.